# රැකියා ඇබෑර්තු

## අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත)

## පහත තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ) | - | තනතුරු 01(ස්ථිර) |
| සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) | - | තනතුරු 01(ස්ථිර) |
| ජ්‍යෙෂ්ඨ සංවර්ධන නිලධාරී | - | තනතුරු 01(ස්ථිර) |
| සංවර්ධන නිලධාරී | - | තනතුරු 03 (ස්ථිර) |
| පුද්ගලික සහකාර | - | තනතුරු 02 ( කොන්ත්‍රාත්) |
| රියදුරු | - | තනතුරු 02 ( ස්ථිර) |

**තනතුර** :- **නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ) - අභ්‍යන්තර අයට පමණි - තනතුරු 01**

**වැටුප් පරිමාණය** :- 91,690-10X2480-15X 3450-168,240-MM 1-1

**අධ්‍යාපන සුදුසුකම්** පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව/පරිසර කෘෂිවිද්‍යාව/පරිසර හා වන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සහ ඉංජිනේරු/ විද්‍යාව/කෘෂි විද්‍යාව/පරිසර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සමග පළමු උපාධිය ලබාගැනීමෙන් පසුව රාජ්‍ය සේවයේ,පළාත් රාජ්‍ය සේවයේ අර්ධ රාජ්‍ය සේවයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනය වසර 10 කට නොඅඩු විධායක ශ්‍රේණියේ පළපුරුද්ද

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යා විෂය පිළිබඳ සාමාන්‍ය උපාධිය සහ විද්‍යානා විෂය පිළිබඳ පිළිසක් විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධිය හදරා තිබීම හා පළමු උපාධිය ලබාගත් පසුව රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ, අර්ධ රාජ්‍ය සේවයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 11 කට නොඅඩු විධායක ශ්‍රේණියේ පළපුරුද්ද.

අපද්‍රව්‍ය /පරිසර කළමනාකරණය හෝ අදාල ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා පළාත් පාලන විෂය පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**තනතුර** : **සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) සිවිල් - ස්ථිර පදනම - තනතුරු 01**

**වැටුප් පරිමාණය** : 91,690-10X2480-15X 3450-168,240-MM 1-1

**අධ්‍යාපන සුදුසුසම්** :- පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව (සිවිල්) පිළිබඳ උපාධියක් සමග වසර 02 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද

**තනතුර** :- ජ්‍යෙෂ්ඨ සංවර්ධන නිලධාරී - ස්ථිර පදනම- තනතුරු 01

**පරිමාණය** :- 74,010-10X1360-18 X 2040-124,330 JM 1-2

**අධ්‍යාපන සුදුසුකම්** :- **බාහිර බඳවා ගැනීම්**

පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංජිනේරු/විද්‍යාව/භූගෝල විද්‍යාව/ සමාජ විද්‍යාව/කෘෂි විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක් සමග අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව වසර 02 ක පළපුරුද්ද හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක සාමාන්‍ය උපාධියක් සහ වසර 02 අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් සමග වසර 03 ක රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පළාත් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද

**අභ්‍යන්තර බඳවා ගැනීම් :**

බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සංවර්ධන නිලධාරී තනතුරෙහි II වන ශ්‍රේණියෙහි වසර 03 ස සේවා කාලයක් සම්පූර්ණකොට ඇති II වන කාර්යක්ෂමතා කඩඉම සමත් අය,

**තනතුර** :- **සංවර්ධන නිලධාරී -ස්ථිර පදනම -තනතුරු 03**

**වැටුප් පරිමාණය** :- 58,740-10X1190-15X 1360-11 X 1670-109,410 MA 5-1

**අධ්‍යාපන සුදුසුසම්** :- **අභ්‍යන්තර/බාහිර**

පිළිගත් විශ්වවිද්‍යාලයක භූගෝල විද්‍යාව/සමාජ විද්‍යාව/කෘෂි විද්‍යාව/පරිසර විද්‍යාව පිළිබඳ උපාධියක්,

**තනතුර** :- **පුද්ගලික සහකාර - කොන්ත්‍රාත් පදනම - තනතුරු 02**

**වැටුප් පරිමාණය** :- 50,540-10X540-7X630-4X1,080-20X1,280-90,270

**අධ්‍යාපන සුදුසුකම්**

**බාහිර බඳවා ගැනීම් :-** වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ඩිප්ලෝමාව සමග අවුරුදු 02 ක පළපුරුද්ද,

**අභ්‍යන්තර බඳවා ගැනීම් :-** අ.පො.ස.(සා.පෙ.) ගණිතය/සිංහල සහ ඉංග්‍රීසි ඇතුළු විෂයයන් 04 කට සම්මාන සාමාර්ථ සමග විෂයෙන් 06 ක් සහ අ.පො.ස.(උ.පෙ) විෂයන් 03 ක් සහ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර තනතුරේ අවුරුදු 06ක පළපුරුද්ද,

**තනතුර** :- **රියදුරු- ස්ථිර පදනම - තනතුරු 02**

**වැටුප් පරිමාණය** :- 43,880-10X490-10X540-10X590-12X630-67,040

**අධ්‍යාපන සුදුසුකම්** :- **බාහිර බඳවා ගැනීම්**

අ.පො.ස.(සා,පෙ.) විෂයන් 06 ක් එකවර සමත්වීම සහ මනා යාන්ත්‍රික දැනුම, වලංගු රියදුරු බලපත්‍රය (මගීන් 32 කට නොඅඩු) රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය, පළාත් අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වසර 06 ක පළපුරුද්ද හා මනා ඇස් පෙනීම.

**වයස් සීමාව -**

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන්ට බල නොපැවැත්වේ.

**වෙනත් කරුණු :-**

1. බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගේ මූලික වැටුපෙන් 10% ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහා ඔවුන් විසින් ගෙවිය යුතු අතර 15%ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහාද 3% ක් සේවා නියුක්ත භාර අරමුදල සඳහා ද අධිකාරය විසින් දරනු ලබයි.
2. බඳවා ගන්නා අයදුම්කරුවන් ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මුල්‍ය රෙගුලාසි, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, ශ්‍රී ලංකා රජය විසින් හෝ බස්නාහිර පළාත් සභාව විසින් පනවා ඇති හෝ විටින් විට පනවනු ලබන නියෝග හා රෙගුලාසිවලට අවනත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :-** අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, නිසි පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ. (බස්නාහිර පළාතේ පදිංචි අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

**ඉල්ලුම් කළයුතු පිළිවෙල :-** සිය විස්තර ඇතුළත් කරමින් ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය 2026,01,19 දින හෝ ඊට පෙර, සභාපති, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප.), තුම්බෝවිල, කරදියාන, පිළියන්දල යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගීවීම වෙනුවෙන් කිසිදු දීමනාවක් ගෙවීමට කටයුතු කරනු නොලැබේ. තවද කිසිදු අයුරකින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට බලපෑම් කිරීම එම තනතුර ලැබීමට නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

**සභාපති,**
**අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය, බස්නාහිර පළාත.**
**2026.01.02**

**දු.ක. අංක - 011-3056703**
**011-2613151**

tamilguru.lk